# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය த. பெ.இ 2171635 Po.Box No — 10120

ෆැක්ස් தொலைநகல Fax — 011-

දුරකථන தொலைபேசி Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය இணையதளம் Web Site — www.Police.lk

ඊ මේල් மின்னஞ்சல் E-mail — dir.media@police.gov.lk


මගේ අංකය எனது இலக்கம் My NO — 1116/2024

ඔබේ අංකය உமது இலக்கம் Your No — / 2024

දිනය திக Date — 07/07/2024 පැය 1020

## මාධ්‍ය නිවේදනය

**01. දිය අනතුරකට ලක්වූ පුද්ගලයින් හය දෙනෙකු බේරා ගැනීම - ත්‍රිකුණාමලය පොලිස් ජීවිතාරක්ෂක ඒකකය.**

2024.07.06 වන දින දහවල් කාලයේ නිලාවේලි වෙරළ තීරයේ දියනාමින් සිටි පුද්ගලයින් හය දෙනෙකු දියවැලකට හසුව ගසාගෙන යමින් සිටියදී ත්‍රිකුණාමලය පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ හා වෙරළ ආරක්ෂක නිලධාරීන් වහාම ක්‍රියාත්මක වී අනතුරට පත් හය දෙනා දිවි බේරාගෙන ගොඩබිමට රැගෙනවිත් ඇත. ඉන් එක් පුද්ගලයෙකු මූලික ප්‍රතිකාර සඳහා නිලාවේලි රෝහලට ඇතුලත් කර ඇත.

**දිය අනතුරට පත් අයවලුන් අවුරුදු 16, 21 හා 28 යන වයස්වල පසුවන පිළිමතලාව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ත්‍රිකුණාමලය පොලිස් ජීවිතාරක්ෂක ඒකකයට අනුයුක්ත පොලිස් සැරයන් 47265 ගුණසේකර, පොලිස් සැරයන් 65565 සමරසිංහ හා පොලිස් කොස්තාපල් 87326 මදුසංක යන නිලධාරීන් විසින් අනතුරටපත් පිරිස බේරාගැනීමට කටයුතු කර ඇත.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කනගරායන්කුලම් පොලිස් ස්ථානය.**

2024.07.06 වන දින සවස් කාලයේ කනගරායන්කුලම් පොලිස් වසමේ කරප්පුකුත්ති ප්‍රදේශයේදී කනගරායන්කුලම් පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23ක් වන කනගරායන්කුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කනගරායන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - බණ්ඩාරවෙල පොලිස් වසම.**

2024.07.06 වන දින සවස් කාලයේ බණ්ඩාරවෙල පොලිස් වසමේ බිඳුනුවැව මිහිඳු මාවත මාර්ගයේ නවතා තිබූ ත්‍රීරෝද රථයක් පිටුපසට ගොස් පෙරළීමෙන් ත්‍රීරෝද රථයේ සිටි කාන්තාවක් තුවාල ලබා දියතලාව රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා බණ්ඩාරවෙල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 68 ක්වූ හීල්ඔය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය **බණ්ඩාරවෙල** රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බණ්ඩාරවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**